# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 11,658—1959 පෙබරවාරි 2 වැනි සඳුද—2.2.1959**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම්

**1959 අංක 50**

අ.ආ.කා අ.කය : **C 162/49 (II)**

කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, ඕ. බී. ඊ. නාමධාරි කේ. අල්වාපිල්ලේ මහතා දිවයිනට පෙරලා පැමිණෙන තුරු, 1946යේ හා 1947තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජ සභා නියෝගවල 51(1) වැනි වගන්තිය යටතේ, ආහාර කොමසාරිස්, සිවිල් නිලධාරි කේ. ඇම්. ඩී. ජයනෙත්ති මහතා, ස්වකීය රාජකාරී වලට අතිරේකව, 1959 පෙබරවාරි 1 වැනි දින සිට, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් තනතුරෙහි වැඩ බැලීමට, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින්, පත්කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1959 ජනවාරි 30 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්‍යාලය.

---

## මිල පාලන දැන්වීම්

කේ.ඇල්. 54 දරණ මිළ නියෝගය. සහල්.

**1950 අංක 29 දරණ මිළ පාලන පනත**

**නියෝගය**

කලුතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් මාලගොඩගමගේ දයානන්ද අමරසිංහ වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 4 වැනි වගන්තියෙන් හා 3(2) යන වගන්තියෙන්ද මා කෙරෙහි පැවරී ඇති බලතල අනුව—

(1) 1959 පෙබරවාරි මස 2 වෙනි දින සිට මීට යාකර ඇති 1 වෙනි උප ලේඛණයේ 2 වැනි තීරයේ සඳහන් මිළ ගණන් තොග වශයෙන් සහල් විකිණීමේදී ශුද්ධ බර හොණ්ඩරයක් එම උප ලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුළ තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(2) 1959 පෙබරවාරි මස 2 වෙනි දින සිට මීට යාකර ඇති 2 වැනි උප ලේඛනයේ 2 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් සිල්ලර වශයෙන් සහල් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක් එම උප ලේඛණයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් තුළ සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙයින් නියෝග කරමි.

(3) තවද, මේ නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) සහල් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ සහල් වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) සහල් ඕනෑම ප්‍රමාණයක් පාරිභෝගය හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(4) සහල් විකිණීමේදී වෙනත් ද්‍රව්‍යයන් හා මිශ්‍රකොට බාල කිරීමෙන් සහල් නොවිකිණිය යුතු බවත්,

(5) සහල් විකිණීමේදී සහල් යම්කිසි දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් එහි මිලත් එම උප ලේඛනවල සඳහන් වැඩිම මිල ගණන් වලට ඇතුළත් වන බවද, නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් යම් ස්ථානයක හෝ සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකු විසින්ම සහල් සඳහා නියම කරනු ලැබූ වැඩිම මිළ සඳහන් දැන්වීමක් එම ස්ථානයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බවත්,

(7) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා ''රාත්තල්'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බව නියම කරමි.

345—ජේ. ඇන්. ආර් 194—3,950 **(1/59)**

(8) මේ මිළ නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සහල් තොග වශයෙන් විකුණනු සෑම තැනැත්තෙකුම හා සහල් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණු දිනය,
(ආ) විකුණු සහල් ප්‍රමාණය,
(ඇ) විකුණු වී ප්‍රමාණය සඳහා ගෙවූ මුදල, සහ
(ඈ) වෙළඳාමේ ස්වභාවය එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළදී ගන්නාට දිය යුතු බවත්, මෙයින් නියම කරමි.

1959 ජනවාරි මස 30 වෙනි දින පෙරවරු 10ට කළුතර දී අත්සන් කරණ ලදී.

එම්. ඩී. අමරසිංහ,
කළුතර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

## 1 වැනි උපලේඛනය

| 1 වැනි තීරය | | 2 වැනි තීරය |
|---|---|---|
| ආදයම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශය | ප්‍රදේශය | ශුද්ධ බර හොණ්ඩර තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ |
| | | රු. ශ. |
| කළුතර | කළුතර | 19 12 |
| එම | මග්ගොන | 19 36 |
| එම | වස්කඩුව | 19 23 |
| එම | අලුත්ගම | 19 27 |
| එම | බේරුවල | 19 38 |
| පානදුර | පානදුර | 19 10 |
| එම | ගොරකපොල | 19 15 |
| එම | වාද්දුව | 19 23 |
| මතුගම | මතුගම | 19 46 |
| එම | වැලිපැන්න | 19 59 |
| එම | මාලබඩ | 19 61 |
| එම | නෑබඩ | 19 65 |
| අගලවත්ත | අගලවත්ත | 19 54 |
| එම | ලත්පඳුර | 19 73 |
| එම | මීගහතැන්න | 19 82 |
| එම | බුලත්සිංහල | 20 06 |
| හොරණ | හොරණ | 19 44 |
| එම | ඉන්ගිරිය | 19 73 |
| එම | මිල්ලෑව | 19 65 |
| එම | මදුරාවල | 19 52 |
| එම | ගල්පාත | 19 40 |
| එම | බන්ඩාරගම | 19 36 |
| එම | පොකුනුවිට | 19 44 |

## 2 වැනි උපලේඛනය

| ගම්.මු. කොට්ඨාශය | ප්‍රදේශය | කලුතර තොටුමන් ආදයම් පාලක නිලධාරි තැනගේ ශාඛාව, සුද්ධ බර රාත්තල් වශයෙන් ශත. |
|---|---|---|
| 717 | දේශාස්ත්‍ර කළුතර | |
| 723 | පලාතොට | |
| 725 | වේලාපුර කලුතර | 17½ |
| 727 | කුඩා හීනටියන්ගල | |
| 730 | කටුකුරුන්ද | |
| 737 | මදිනකන්ද | |
| 710 | කුඩා වස්කඩුව | |
| 734 | මහ වස්කඩුව | |
| 715 | දෙදියවල ... | |
| 716 | උග්ගල්බඩ | |
| 718 | එතන මඩල | |
| 719 | කොහොලාන | |
| 720 | උක්වත්ත... | |
| 721 | බොලොස්සගම | |
| 722 | සේරුපිට | |
| 724 | ගමගොඩ | |
| 726 | රෙමුනගොඩ | |
| 727ඒ | මහ හීනටියන්ගල | |
| 728 | බෝම්බුවල | 18 |
| 729 | නාගොඩ ... | |
| 731 | කලමුල්ල | |
| 732 | ඇතගම ... | |
| 733 | සුවඳව්විමුල්ල | |
| 735 | මහ පයියාගල | |
| 741 | දියලගොඩ | |
| 742 | මග්ගොන බටහිර | |
| 743 | මග්ගොන නැගෙනහිර | |
| 746 | මාගල්කන්ද | |
| 747 | කරඳගොඩ | |
| 748 | පොල්කොටුව | |
| 749 | කන්කානන්ගොඩ | |
| 750 | වුල්පිට | |

| ගම්.මු. කොට්ඨාශය | ප්‍රදේශය | කලුතර තොටුමන් ආදයම් පාලක නිලධාරි තැනගේ ශාඛාව, සුද්ධ බර රාත්තල් වශයෙන් ශත. |
|---|---|---|
| 751 | දීනගොඩ | |
| 753 | පරනකඩේ | |
| 751 | හෙට්ටිමුල්ල | |
| 754 | මරදන ... | |
| 755 | මාලිගාහේන | |
| 756 | මහගොඩ | |
| 757 | මස්සල්ගොඩ | 18 |
| 762 | කලුවාමෝදර | |
| 763 | ගනේගම | |
| 764 | අලුත්ගම බටහිර | |
| 765 | අලුත්ගම නැගෙනහිර | |
| 766 | අලුත්ගම් විදිය | |
| 769 | වරාපිටිය | |
| 734 | කුඩා පයියාගල | |
| 736 | පිනිදියමුල්ල | |
| 738 | පාලයන්ගොඩ | |
| 739 | මහගම්මැද්ද | |
| 740 | පොතුවිල | |
| 744 | හල්කඳවිල | |
| 745 | මුංහේන | |
| 752 | අම්බෙපිටිය | |
| 759 | පිංහේන ... | |
| 760 | මොරගල්ල | 18 |
| 761 | මුල්ලෙපිටිය | |
| 767 | කාලවැලි ... | |
| 768 | පාඩගොඩ | |
| 770 | මාලේවන | |
| 771 | බෙන්දුපිටිය | |
| 772 | ඉදිගස්තුඩුව | |
| 775 | දේවගොඩ | |
| 776 | ලුද්දුව ... | |
| 797 | කීරන්තිඩිය | |

| ගම්.මු. කොට්ඨාශය | ප්‍රදේශය | කලුතර තොටුමන් ආදායම් පාලක නිලධාරි තැනගේ ශාඛාව, සුද්ධ බර රාත්තල් වශයෙන් ශත. |
|---|---|---|
| 671 | ගොරකාන | |
| 672 | කෙසෙල්වත්ත | |
| 673 | සරික්කාමුල්ල | |
| 674 | ගොරකපොල | |
| 675 | වේරවත්ත | |
| 676 | ගල්තුඩේ | |
| 679 | වලාන | |
| 680 | බෙක්කෙගම | |
| 681 | තන්තිරිමුල්ල | 17½ |
| 682 | උඩහමුල්ල, පට්ටිය | |
| 683 | වල්පොල, පට්ටිය | |
| 684 | මාලමුල්ල | |
| 685 | පට්ටිය | |
| 686 | පට්ටිය | |
| 692 | නල්ලුරුව | |
| 687 | වැකඩ | |
| 670 | හොරේතුඩුව | |
| 677 | හිරන | |
| 678 | අරුක් ගොඩ | |
| 688 | පින්නවල | |
| 689 | කලුදැවල | |
| 690 | මහවිල | |
| 691 | අලුබෝමුල්ල | |
| 693 | දිබ්බැද්ද | |
| 694 | පමුණුගම | |
| 695 | මහබෙල්ලන | 18 |
| 696 | පින්වත්ත | |
| 697 | තල්පිටිය දකුණ | |
| 697ඒ | තල්පිටිය උතුර | |
| 698 | මහ වාද්දුව නැගෙනහිර | |
| 699 | මහ වාද්දුව බටහිර | |
| 702 | කුඩා වාද්දුව | |
| 703 | මැලේගම | |
| 704 | මොල්ලිගොඩ | |
| 707 | පොහොද්දරමුල්ල | |
| 708 | පොතුපිටිය | |
| 700 | මැස්ටිය | |
| 701 | ගෝනදූව | |
| 705 | මාවල | |
| 706 | මොරොන්තුඩුව | |
| 709 | කලපුගම | 18 |
| 709ඒ | දෙල්දූව | |
| 711 | පනාපිටිය | |
| 712 | පරදූව | |
| 713 | දියගම | |

**රයිගම් කෝරළයේ ප්‍රා. ආ. නි. ගේ කොට්ඨාශය**

| ගම්.මු. කොට්ඨාශය | ප්‍රදේශය | ශත. |
|---|---|---|
| 639ඒ | දෙල්ගොඩ | |
| 641 | පනාගොඩ | |
| 642 | ගල්පාත | |
| 656 | රයිගම | |
| 659 | අටුලුගම | |
| 661 | ගැලනිගම | 18 |
| 662 | වැව්ට | |
| 663 | බන්ඩාරගම | |
| 665 | රමුක්කන | |
| 666 | කඹුරුගොඩ | |
| 667 | ගම්මන්පිල | |
| 604 | පොල්‍රොන්නරුව | |
| 606 | වැල්මිල්ල | |
| 608 | පොකුණුවිට | |
| 609 | හේනේගම | |
| 610 | කුලුපන | |
| 615 | හොරණ | |
| 616 | මුනගම | 18 |
| 618 | කිලුපන | |
| 619 | නම්බපාන | |
| 620 | ඉන්ගිරිය | |
| 624 | හඳපාන්ගොඩ | |
| 628 | මිල්ලෑව | |

| ගම්.මු. කොට්ඨාශය | ප්‍රදේශය | කලුතර තොටුමන් ආදායම් පාලක නිලධාරි තැනගේ ශාඛාව, සුද්ධ බර රාත්තල් වශයෙන් ශත. |
|---|---|---|
| 634 | යාල | |
| 635 | අඹුරුවාතොට | |
| 636 | යාල | |
| 637 | අඹුරුවාතොට | |
| 639 | පාතකඩ | |
| 640 | යටවර | |
| 641 | පනාගොඩ | |
| 643 | පැල්පොල | |
| 644 | රද්දෙගොඩ | |
| 645 | මිල්ලනිය | 18 |
| 649 | බටගොඩ | |
| 655 | ගුංගොමුව | |
| 657 | කොලමැදිරිය | |
| 658 | කිම්මන්තුඩාව | |
| 660 | බමුණුමුල්ල | |
| 664 | විදියගොඩ | |
| 668 | අලුත්ගම | |
| 629ඒ | කිදෙල්පිටිය | |
| 629 | කිදෙල්පිටිය | |
| 605 | ඔලබොඩුව | |
| 607 | කුඹුක | |
| 611 | බටුවිට | |
| 612 | කහටපිටිය | |
| 613 | තලගල | |
| 614 | උඩුව දකුණ | 18½ |
| 614ඒ | උඩුව උතුර | |
| 617 | මීවනපලාන | |
| 617ඒ | ගුරුගොඩ | |
| 618ඒ | වගවත්ත | |
| 621 | පලාපිටියගොඩ | |
| 622 | මාපුටුගල | |
| 623 | ඉලිඹේ | |
| 623 | බටගම්පොල | |
| 625 | මෙනේරිගම | |
| 626 | කඳනපිටිය | |
| 627 | අරකාවිල | |
| 629 | කොටියන්ගොඩ | |
| 631 | හාන්දුපැල්පොල | |
| 633 | වේරවත්ත | |
| 638 | උඩුවර | 18½ |
| 638ඒ | කෙසෙල්හේනාව | |
| 646 | ලන්ගන | |
| 647 | හල්තොට | |
| 650 | රෙමුන | |
| 651 | ලබුගම | |
| 652 | කිම්මන්තුඩාව | |
| 653 | යාලගල | |
| 654 | වැලිකල | |
| 630 | දඹර | |

**පස්දුන් කෝරළයේ ආ.පා.නි.ගේ කොට්ඨාශය**

| ගම්.මු. කොට්ඨාශය | ප්‍රදේශය | ශත. |
|---|---|---|
| 829 | අගලවත්ත | |
| 830 | යටියන | |
| 835 | ලත්පඳුර | 18 |
| 839 | බදුරලිය | |
| 839ඒ | මගුර | |
| 818 | වේයන්ගල්ල | |
| 819 | මහගම | |
| 820 | දියකඩුව | |
| 823 | පින්නගොඩ | |
| 826 | ඔමත්ත | |
| 827 | පිඹුර | 18½ |
| 827 | ගිරිකොළ | |
| 832 | මූලටියන | |
| 833 | කිතුල්ගොඩ | |
| 834 | යකුපිටිය | |
| 834 | බෙල්ලන | |

පස්දුන් කෝරළයේ ආ. පා. නි. ගේ කොට්ඨාශය

| ගම්.මු. කොට්ඨාශය | ප්‍රදේශය | කලුතර තොටුමන් ආදයම් පාලක නිලධාරි තැනගේ ශාඛාව, සුද්ධ බර රාත්තල් වශයෙන් ශත. |
|---|---|---|
| 836 | ... පැලැන්ද ... | |
| 836ඒ | ... මොරිපිටිය | |
| 837 | ... මීදලන ... | |
| 837ඒ | ... පැනිගල | |
| 838 | ... හැඩිගල්ල | 18½ |
| 840 | ... කලුගල ... | |
| 841 | ... අටාල ... | |
| 846 | ... කෙවිටිගල | |
| 870 | ... කුඩලිගම | |
| 828 | ... උඩුවෙල | |
| 788 | ... මකලන්දව | |
| 789 | ... ගුලවිට ... | |
| 822ඒ | ... හල්වතුර ... | |
| 843ඒ | ... පහල හෙවෙස්ස | |
| 844 | ... රත්මලේ ... | 18½ |
| 845 | ... කුරුපිට | |
| 848 | ... මොරගල | |
| 850 | ... පැලවත්ත | |
| 821 | ... බුලත්සිංහල | |
| 843 | ... ඉහල හේවැස්ස ... | 19 |
| 812 | ... දේවමුල්ල | |
| 813 | ... ඉහල නාරගල | |
| 814 | ... ගෝවින්න | |
| 814ඒ | ... රටියල ... | |
| 821ඒ | ... දෙලේමැල්ල | |
| 822 | ... බෝක්කලේ | 19 |
| 823 | ... යටිගම්පිටිය | |
| 824 | ... ඉහල වෙල්ගම | |
| 825 | ... මෝල්කාව | |
| 825 | ... පරගොඩ | |
| 842 | ... මොරළුගොඩ | |
| 805 | ... මතුගම ... | |
| 792 | ... ලෙව්වන්දුව | |
| 793 | ... වැලිපැන්න බටහිර | |
| 793ඒ | ... වැලිපැන්න බටහිර | 18 |
| 795 | ... ඕවිටිගල | |
| 804 | ... පාන්තිය ... | |
| 807 | ... පහල නැබඩ | |

| ගම්. මු. කොට්ඨාශය | ප්‍රදේශය | කලුතර තොටුමන් ආදයම් පාලක නිලධාරි තැනගේ ශාඛාව, සුද්ධ බර රාත්තල් වශයෙන් ශත |
|---|---|---|
| 773 | ... වලගෙදර | |
| 777 | ... ඉත්තාපාන | |
| 779 | ... ලූල්බද්දුව | |
| 780 | ... හල්වල ... | |
| 786 | ... උඩුගම ... | |
| 789 | ... කොටගෙදර | |
| 790 | ... ඌරුගොඩ | |
| 791 | ... පන්නිල ... | |
| 794 | ... හොරවල | |
| 796 | ... බදුගම ... | |
| 799 | ... පූහාබුගොඩ | |
| 800 | ... දෙඩන්ගොඩ | |
| 802 | ... බෝපිටිය | 18½ |
| 802ඒ | ... යටදෙලවත්ත | |
| 803 | ... හේනේගම | |
| 806 | ... ඉදේගොඩ | |
| 808 | ... තුඩුගල ... | |
| 809 | ... තෙබුවන | |
| 810 | ... පැලපිටියගොඩ | |
| 811 | ... කරන්නාගොඩ | |
| 815 | ... නාහල්ල | |
| 816 | ... වරකගොඩ | |
| 849 | ... මීගහතැන්න | |
| 803 | ... නාරවිල ... | |
| 806 | ... ඉහල නැබොඩ | |
| 765 | ... යගිරල ... | |
| 782 | ... පරගම ... | |
| 783 | ... ගම්මන ... | |
| 784 | ... කරපගල ... | 18½ |
| 787 | ... වලල්ලාවිට | |
| 814 | ... ලිනියාව | |
| 781 | ... මතුගම ... | |
| 847 | ... කළුපහන | |

සැලකිය යුතුයි.—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියම මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි ඉහාම වැඩි මිළ ගණන්ය. ඒ මිළ ගණන් වලට ඉහළින් විකිණිය නොහැකිය.

(2) ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි තොග වශයෙන් විකුණනු ලබන යම් සහල් ප්‍රමාණයක් වුනොත් එයට ගෙවිය යුතු වැඩිම මිළ ශුද්ධ බර හොණ්ඩරයට ගෙවන ඉහත සඳහන් මිළ අනුව ගණන් බලා මිළ තීරණයක් ගත යුතුය.

---

කේ. ඇල්. 55 වෙනි අංකය දරන මිළ නියෝගය.

අතිරේක ආහාර ද්‍රව්‍ය
උම්බලකඩ.

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මිළ ආහාර පාලක තැන්පත් මාලගොඩගමගේ දයානන්ද අමරසිංහ වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරන වගන්තිය සමග කියවියයුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 අගෝස්තු 23 වෙනි දින අංක 11,480 දරණ ලංකා ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1958 අගෝස්තු 19 වෙනි දින අංක කේ. ඇල්. 47 දරණ ආහාර මිළ නියෝගය උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව, එම උප ලේඛනයේ 2 සහ 3 වැනි තීරවල පිළිවෙලින් දක්වෙන තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළද, සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් විකිණීමේ වැඩිම මිළද මෙම නියෝගයෙන් 1959 පෙබරවාරි 1 වෙනි දින සිට අවලංගු කරමි.

(2) තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර හොණ්ඩරයක්ද සිල්ලර වෙළෙන්දෙකු සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර රාත්තලක්ද, කළුතර දිස්ත්‍රික්කයේ සීමාවන් තුල විකිණිය හැකි වැඩිම මිළ 1959 පෙබරවාරි 1 වෙනි දින සිට මෙම උප ලේඛනයේ 2 සහ 3 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිළ අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම කළුතර දිස්ත්‍රික්කයේ සීමාවන් තුල උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද කළුතර දිස්ත්‍රික්කයේ සීමාවන් තුල යම් ස්ථානයක හෝ වාහනයක උප ලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සැම වෙළෙන්දෙකුට මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරණ ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙණෙන පරිදි තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයේ කාය්‍ය සඳහා " රාත්තල " හෙවත් " රා. " යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) එසේම කළුතර දිස්ත්‍රික්කය තුල උම්බලකඩ තොග වශයෙන් විකුණන සැම තැනැත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සැම තැනැත්තෙකුම මිළයට ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන්, එනම්—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය ;
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් දිය යුතු බවද නියම කරමි.

(8) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිලත් උප ලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුලත්වී ඇති බවද නියම කරමි.

1959 ජනවාරි 31 දින පෙරවරු 11.30 ට කළුතර දී අත්සන් තබන ලදී.

ඇම්. ඩී. අමරසිංහ,
කළුතර දිස්ත්‍රික්කයේ සහකාර මිල ආහාර පාලක තැන.

## උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| විස්තරය | තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් ශුද්ධ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ | සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ |
| | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ සියලුම වර්ගවල ... ... ... | 248 20 ... | 2 48 |

**සැලකිය යුතුයි.**——මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.